# අසනි

සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත

2023 ජන- පෙබ
49 වන කලාපය.
රු. 50/=

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කරන ලදි


ධනපති පංතියට
විකල්පය ලෙස
**වාමාංශික පෙරමුණ**
**ගොඩනගමු..!**

# පුංචි ඡන්දය
# ආණ්ඩුවේ මළගමයි..!

**පළාත් පාලන මැතිවරණයට නාම යෝජනා කැඳවීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර තිබේ. මෙම මැතිවරණය කල් දැමීමට පාලකයින් ගත් උත්සාහය අසාර්ථක වූ බව පෙනී ගියත්, ආණ්ඩුවේ දේශපාලන වුවමනාව යටපත්වී නොමැති බව පෙනේ. එය වඩාත් සනාත වන්නේ විශ්‍රාමික හමුදා නිලධාරියෙකු යොදවා ගනිමින් උසාවි නියෝගයක් ගැනීමට උත්සාහ කිරීමෙනි. මේ අතර මැතිවරණ කොමිෂන් සභාව තුළ බෙදීම් නිර්මාණය කිරීමට ද පාලකයින් කයටයුතු කරමින් තිබේ. මේ සියලු කුමන්ත්‍රණ පරාජය කිරීමට පෙරට එන ලෙස අපි ජනතාවට ආයාචනය කර සිටිමු.**

වත්මන් සමාජ පසුබිම තුළ දිග හැරෙන අතිශය ගැඹුරු අර්බුදය තුළ මැතිවරණයක් ගැන කතා කිරීම පාලකයාන්ට තවත් මරණිය තර්ජනයකි - ආණ්ඩුව සම්බන්දයෙන් පොළවේ පවතින ජන මතය මැතිවරණ ප්‍රතිඵල සමඟ ප්‍රකාශයට පත්වනු ඇත. පාලකයින් ප්‍රකාශ කරන්නේ බිලියන දහයකට අධික ප්‍රමාණයක් මුදල් වැය කිරීම පවත්නා අර්බුදය තවත් උග්‍ර කිරීමක් වනු ඇති බවය. මෙලෙස ජනතාව ගැන දයාව, කරුණාව පෙන්වා තම පාලනායේ පැවැත්ම ආරක්ෂා කර ගැනීම ඔවුන්ගේ එකම අපේක්ෂාව වේ. මැතිවරණයට මුදල් වැය කිරීම මහා අපරාදයක් යැයි පාලකයින් තම කේවට්ටයින් යොදා ගන්මින් කරන ප්‍රකාශ වල කිසිඳු වලංගු තාවක් නොමැත. රාජ්‍ය ආදායමෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් වැයකර ඇත්තේ ආරක්ෂක අමාත්‍යාංශයට ද ජනාධිපති ඇතුළු ඔවුන්ගේ කාර්යමණ්ඩලය සඳහා ය. මෙලෙස අතිශය මුදල් ප්‍රමාණයක් වැය කරමින් තිබේ - එමෙන් ම වංචා දූෂණ දිනෙන් දින වැඩි වෙමින් ඇත. මෙවන් සමාජ ව්‍යසනයක් තුළ ජනතාව ජීවිතයත් මරණයත් අතර තම පැවැත්ම ඉදිරියට ගෙන යාම සඳහා අභියෝග වලට මුහුණ දෙමින් සිටී. ඡන්දය යනු ජනතාවගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ලබා ගැනිමකි. එයට අභියෝග කිරීමට කිසිදු ජන වරමක් නැති රනිල් වික්‍රමසිංහ ට නොමැති බව අප අවධාරණය කරමු.

මේ තත්වය තුළ දීර්ඝ කාලයක් රට තුළ මතුවෙමින් තිබු දූෂිත අත්තනෝමතික මර්දන කාරී ජන පීඩක මජර ආණ්ඩුව එලවා දැමීම ජනතාවගේ බහුතර අපේක්ෂාව වී තිබේ. මෙම පළාත් පාළන මැතිවරණ වලින් ලැබෙන ජනතා අනුමැතිය සමස්ත පාලකයින් එලවා දැමීමට ලැබෙන ජන වරමක් වනු ඇත. 2022 මාර්තු - ජූලි අරගලය විසින් මහින්ද, බැසිලි, ගෝඨා එලවා දැමීමට ඉදිරියට පැමිණි ජනතාව 2023 මැද භාගය වන විට රනිල් රාජපක්ෂ පාලනයේ මලගම උදාකිරීමට පෙරට පැමිණෙන බව මැතිවරනණ ප්‍රතිඵල සමඟ ඉදිරියට එන අප පසක් කර සිටින්නෙමු.■

## මැතිවරණයේ දී
## විප්ලවකාරී වමක් සඳහා
## සටන් වදිමු..!

මෙවර පළාත් පාලන මැතිවරණයේ දී වත්මන් පාලකයින් අනුගමනය කරන ව්‍යවසනකාරී සමාජ ප්‍රතිපත්ති පරාජය කිරීම සඳහා ඊනියා ධනපති විපක්ෂ බලවේග වලට එරෙහිව ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය තරඟ කිරීමට තීන්දු කර තිබේ. කොළඹ නගර සභාව, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව, මොනරාගල, හම්බන්තොට යන පළාත් පාලන ආයතන වලට නාම යෝජනා භාරදීමට සූදානම් කරමින් තිබෙන බව ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම් මහින්ද දේවගේ සහෝදරයා 'අසනි' වෙත ප්‍රකාශ කරනු ලැබීය.■



## කොළඹ අල්ලමු..!
## වෙනස් කරමු..!

කොළඹ මහ නගර සභාවට
ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය,
අරගලකරුවන් සමග
සටන්වදී..

## අසනි කව් ගී..

*යදමින් නිමැවී*
*යහමින් පවතී*
*කම්කරු බල මුළු රටක බලේ..!*

*අරගල කරමින්*
*මාවත සදමින්*
*පෙරටම යා යුතු සමගි බලේ..!*


*සිඳ බිඳ බැමි - ගැට*
*නොවේ උගහට*
*යා හැකි පෙරටම ජය දිදුලේ..!*

## කොසු ඉදල් ගෙන අපේක්ෂකයින් පිළිගැනීමේ සූදානමක්..!

විදුලිබල ඇමති කාන්චන කියා සිටින්නේ විදුලි බිල වැඩි කිරීම අනිවාර්යෙන්ම කළ යුතු බවය. එසේ නොමැති වුවොත් පැය ගණනාවක් විදුලිය කපා දැමීමට සිදුවන බව ඔහු කියා සිටී.

බදුබරින් හා ජීවන බරින් මිරිකී සිටින ජනතාව මේ නිසා අතිශය පීඩනයකට පත්වනු ඇත. විදුලි බිල වැඩි කරන අනුපාතය දැනට තිබෙන ප්‍රමාණයට වඩා තවත් දෙගුණ වන බව ද ප්‍රකාශ කර සිටී.

මෙවන් තත්ත්වයක් තුළ ඇඟලුම් කර්මාන්තය ඇතුලු සුළු ව්‍යාපාර කඩා වැටීම නිසා විරැකියාවට වැටෙන ප්‍රමාණය තවත් ඉහළ යනු ඇත. ඒ සමඟ සේවා හා භාණ්ඩ මිල ඉහළයාම නිසා සමන්ත ජන ජීවිතයට විය හැකි ව්‍යවසනය හමුවේ ආණ්ඩුව නියෝජනය කරන අපේක්ෂකයින් ඡන්දය ඉල්ලා පැමිණියහොත්, නම් ඔවුන් පැළිගැනීමට කාන්තාවන් තම ගෙවල්වල කොසු ඉදල් සූදානම් කරමින් සිටින බව බොහෝ ප්‍රදේශවල සාකච්ඡාවට ලක්වෙමින් තිබේ.■



# රට ගිනි කන්දක් උඩ

2022 වසරේ විනාශයට මූලික වූ ගෝඨා පාලනය පරිදි ම 2023 විනාශයේ මූලිකයා වන්නේ රනිල් රාජපක්ෂ පාලනය බව පෙනේ. මේ වන විටත් රනිල් වික්‍රමසිංහ ඉදිරියට ගෙන යාමට උත්සාහ කරන පාලනය මගින් ඒ බව දකින්නට හැකි වේ. ගෝඨාභය සිදු කළ ආණ්ඩුකරණයේ වැරදි ඉතා ආඩම්බරයෙන් රනිල් වික්‍රමසිංහ සිදු කිරීම යි. ඔහු ඉදිරිපත් කළ මෙවර අය වැය තුළ සම්පූර්ණව කියා පාන්නේ නව ලිබරල්වාදී ආර්ථිකය නැවත වෙනත් මුහුණුවරකින් ඉදිරියට ගැනීමකි. එහි සමහර අංග ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවා අතහැර දමා තිබෙන ඒවා ය. එහි සඳහන් කරන සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සකසා ඒවාට ප්‍රමුඛත්වය දීම මගින් රට වැටී තිබෙන තීව්‍ර අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නව අංගයන් ය. ඒවා ඉතිහාසයේ අයි. එම්. එෆ්. එක විසින් යෝජනා කර නොතිබිණි. රනිල්ගේ අය වැය ඉදිරිපත් කිරීම තුළ සමාජ ආරක්ෂක වැඩ පිළිවෙළක් ගැන කෙටියෙන් සඳහන් කර තිබුණත් ඒ ගැන පැහැදිලි කිරීමක් දකින්නට නොහැකි විණ. ඔහු උජාරුවෙන් කියා පෑ මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්ති රාමුවේ ඇති ආර්ථික උපාංග දෙක වන්නේ රාජ්‍ය අංශයේ පුද්ගලීකරණය කිරීම සහ නිර්යාත ආදායම වර්ධනය කරන නව ආර්ථික උපාය මාර්ගයන් වේ. ඔහු මේ නිර්යාත සමාජ ආරක්ෂණ උපාය මාර්ගය විස්තර කිරීමෙන් වැලකී සිටියේ ය. ඔහු කියා පෑවේ අය බදු ප්‍රතිසංස්කරණය සහ අනෙකුත් ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැගීම තුළින් දැනට උග්‍ර වෙමින් පවතින අර්බුදය තව තවත් තීව්‍ර වීමයි. දුර්වල මට්ටමකින් හෝ පවතින සමාජ ආරක්ෂණ යාන්ත්‍රනය විනාශ කිරීම ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලධාරීන්ට වඩා ඔහු මූල්‍ය අරමුදල්කරණය වී තිබේ. ආර්ථිකය ගොඩ දැමීම කෙසේ වුවත් ආර්ථික වෘද්ධියත්, සමාජ සාමයත් යන දෙක ම මරණීය අනතුරකට ඇද දමා තිබේ. මේ මගින් 2023 දී උග්‍රවන සමාජ ව්‍යසනය අතිශය දරුණු වේ. මේ පාලනය හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිපත්ති මූලය වන්නේ මේ අර්බුදය නිර්මාණය කිරීමට හේතු වූ නව ලිබරල් දූෂිත ආර්ථික රාමුව කිසිදු සංශෝධනයකට බඳුන් නොකර නව ලිබරල්වාදී ලක්ෂණ සහ ආර්ථික දූෂණයේ අවකාශ තව තවත් ශක්තිමත් කරන ආර්ථික විග්‍රහයකි. මේ වන විටත් විද්‍යමාන වී ඇති පරිදි නව ලිබරල්වාදය යනු නාගරික මිථ්‍යාවකි. එය මනෝ රාජ්‍යයකි. අනාගතය සඳහා හොඳ ෆැන්ටසියක් බව යෝජනා වී ඇත. මූල්‍ය ධනපතීන් ඇතුලුව ප්‍රධාන ධනපති කොටස් සහ මේ නව ලිබරල් වැඩ පිළිවෙලේ නියමුවෝ ය. නිෂ්පාදනය , පාරිභෝජනය සහ පොහොසත් වීම ඔවුන්ගේ සටන් පාඨ වී තිබේ. රනිල් ක්‍රියාවට නගන්නේ මේ ආර්ථික වැඩ පිළිවෙල මඟින් විදේශීය සහ දේශීය ජාවාරම්කාර බලවේගවලට මග විවෘත කිරීම ය. ඔහුට අවශ්‍ය වන්නේ වාණිජ්‍ය ධනපති බලවේග ආරක්ෂා කර දුන් දුගී දුප්පත්කම සමාජගත කිරීම ය.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මේ අර්බුදය ඩොලර් හිඟවීමේ අර්බුදයක් බවට අර්ථ ගන්වන්නට උත්සාහ දරයි. මේ නිසා විදේශ විනිමය අර්බුදය කෙටි කාලීනව විසදා ගැනීමට හදිසි ක්‍රියාමාර්ග ගැනීම මගින් අර්බුදය තවත් උග්‍ර කරනු ඇත. මේ මගින් 2022 වසරේ ඉදිරියට පැමිණි අර්බුදයේ තවත් දිගුවක් වීම වැලැක්වීමට නොහැක. දැනට නිමා වෙමින් පවතින වසර 2022 ක තුල ඇති වූ අර්බුදය පෙර දකින්නට පොදු ජන පෙරමුණට නොහැකි වූවා සේ ඉදිරි ව්‍යසනය තේරුම් ගැනීමට ඔහුනට කිසිදු සංවේදී බවක් නැත. මෙම අර්බුදය නැවත ඉදිරියට ඇදීම තුළින් තියුණු දේශපාලන අර්බුදයකට මඟ සලකුණු කරනු ඇත. එය මැයි ජූනි, ජූලි, අරගලයකට වඩා වර්ධනය වනු ඇත. පසුගිය අරගලය ඇති වීමට තුඩු දුන් වාස්තවික සහ විෂය මූලික තත්ත්වයන්ම එසේම පවතින අතර , ඉදිරියේ දී එය තවත් උග්‍ර වනු ඇත. මේ පාලකයින් සිටින්නේ ගිනි කන්දක් උඩ බව ඔවුන් නොදනී. එය අළු යට ගින්නක් සේ නැවත මතු වීම වැලැක්වීමට නොහැක.

ඉදිරි අරගලය රාජ්‍ය බලය යොදවා මර්දනය කිරීමට ගන්නා උත්සාහය ඔවුන්ගේ මිනීවල ඔවුන් විසින්ම කපා ගැනීමක් වනු ඇත. ■



මහින්ද දේවගේ
ප්‍රධාන ලේකම්
ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය

## අපි පෙනී සිටින්නේ කුමක් සඳහා ද?

ශ්‍රී ලංකා සමාජවාදී පක්ෂය ජනවාර්ගිකත්වය , උපන් ස්ථානය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආගම නොසලකා ලාංකේය සමාජයේ සමස්ත වැඩ කරන ජනතාවගේ පූර්ණ සමාන ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සපුරා ගැනීමට කැප වී සිටී.

පසුගිය සිවිල් යුද්ධ සමයේ සිට හඳුන්වා දෙන ලද සියලු මර්දන නීති අහෝසි කිරීමට හා එම නීති යටතේ සිරගත කර සිටින සියලු දෙනා වහා ම නිදහස් කරන ලෙස ඉල්ලා සිටිමු.

කෙසේ වුවද ධනවාදය යටතේ සමානාත්මතාවය කිසිදාක සම්පූර්ණ හෝ ස්ථාවරව මුදුන් පමුණුවා ගත නොහැකි ය. පාර්ලිමේන්තු ක්‍රමයේ හිස් දේශපාලන පිළිවෙත්වලට අපව සීමා වී සමාජ සාධාරණත්වය මුදුන්පත් කර ගැනීමට හැකි වන්නේ නැත. මාක්ස්වාදී විග්‍රහයන්ට අනුව වත්මන් ධනේෂ්වර සමාජය ඇතුලත එය පෙරළා දැමීම සඳහා ඇතිවන සියලු අරගලවලට අපි අඛණ්ඩව මැදිහත් වෙමු. එවැනි අරගලයන් ඉදිරියට ගෙන යාම සඳහා ජාතික සීමා මායිම් තුළ රැඳී නොසිටින අතර, අප අපගේ බලවේග එම අරගලයන් ඉදිරියට ගෙන යාම සඳහා ඉන්දියාවේ අසල්වැසි රටවල් සමඟද ලොව පුරා වැඩ කරන බලවේග සමඟ එම සටන් බද්ධ කිරීමට කටයුතු කරන්නෙමු. මෙය නිර්වචනය කරන්නේ නම් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ තිරසාර ධනේෂ්වර සංවර්ධනයක් වෙනුවට ස්ථාවර සමාජවාදී සැලසුම්ගත ආර්ථිකයක් ගොඩ නැගිය යුතු බව අවධාරණය කරමු. (තනි රටක සමාජවාදී පාලනයක් වෙනුවට ට්‍රොට්ස්කි විසින් අවධාරණය කරන ලද නොනවතින විප්ලවය මත පදනම් ක්‍රියාවට නැගීම) මෙම උපාය මාර්ගය මත පදනම් වෙමින් අපි ප්‍රජාතාන්ත්‍රික අයිතීන් සඳහා වන අරගලය ධනවාදයට එරෙහි අරගලය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා සටන් වදිමු. එසේම ධනපති ක්‍රමය තුළ මතුවන ආර්ථික අසාධාරණය , සමාජ අසාධාරණය , පාරිසරික විනාශය ගොවි ජනතවාගේ හා සෙසු පීඩිත ජනතාවගේ ගැටලු සඳහා අප විසින් ස්ථිරසාර විසඳුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරමු.

එපරිද්දෙන් ම අපි කම්කරු පන්ති දේශපාලන අරගලයේ විප්ලවීය විධික්‍රම, නිර්ධන පංතිය මහජන බල මුළු ගැන්වීම මහජන සහ මහා වැඩ වර්ජන , හදිසි සහ ප්‍රජාතන්ත්‍රීය ඉල්ලීම් මුදුන්පත් කර ගැනීමේ ක්‍රම භාවිත කිරීම අවශ්‍ය යැයි විශ්වාස කරමු. අරගලයේ ඉහල ලක්ෂයේ දී කම්කරු සභා සහ ෆැක්ට්‍රි කමිටු වැනි කම්කරු පන්ති දේශපාලන ආයතන නිර්මාණය කිරීම අවශ්‍ය වේ. එසේම එයින් එවැනි ආයතන ආරක්ෂා කිරීමේ මාධ්‍යයන් ගොඩ නැගීමේ හා කම්කරු ආරක්ෂක ඒකක හා අවසානයේ දී කම්කරු මිලීෂියාවක් හරහා ඒවායේ තීරණ ක්‍රියාත්මක කිරීම ද අදහස් කරයි. අපේ අරමුණ කම්කරුවන්ගේ සහ කුඩා ගොවීන්ගේ ආණ්ඩුවක් හා බහු ජනතාවගේ අවශ්‍යතා සපුරාලිය හැකි සම්පූර්ණ සමාජගත කළ හැකි සැලසුම්ගත ආර්ථිකයක් විය යුතු ය. මෙම අරමුණ මුදුන් පමුණුවා ගත හැක්කේ විප්ලවීය කම්කරු පංති බහුජන පක්ෂයක නායකත්වය පමණක් යටතේ වන අතර එවැනි පක්ෂයක් ගොඩ නැගීම සඳහා අපි පෙනී සිටිමු.

ඉදිරි අරගලයේ දී දිග හැරෙන දේශපාලන වර්ධන පෙර ගෙන යාම සඳහා පහත සඳහන් පරිදි සටන් පාඨ පෙළ ගස්වා ගත යුතුව තිබේ.

- **ඇමරිකාව, චීනය, ඉන්දියාවේ ප්‍රමුඛ රටවලින් තබා ගෙන තිබෙන ණය ඇතුලු සියලු විදේශ ණය වහාම අහෝසි කරමු.**
- **ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුලු මූල්‍ය සංවිධානය විසින් අටවන මර උගුලෙන් ගැලවීමට බල කරමු.**
- **රට පුරා මතුවන ජනතා අරගල ඒකාබද්ධ කර ගනිමින් කම්කරුවන් , ගොවීන් ඇතුලු පීඩිත සමාජ බලවේග බලමුළු ගැන්වීමට කටයුතු කිරීම ද එම ජන කොටස් නියෝජනය වන පරිදි ව්‍යවස්ථාදායක සම්පාදන මණ්ඩලයක් ගොඩ නැගීමට බල කරමු.**
- **ස්වයංනිර්න අයිතිය මත පදනම් වී ජාතික ප්‍රශ්නයට විසඳුම් ලබා දීම**
- **විධායක ජනපති ධූරය වහා අහෝසි කර රනිල් රාජපක්ෂ පාලනය කපෝති කරනු !**
- **සියලු මර්ධන නීති අහෝසි කිරීම**
- **ජනතාවට සංවිධානය වීමට ඇති අයිතිය අදහස් පල කිරීමට ඇති අයිතිය තහවුරු කරමු.**
- **සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම**
- **වත්මන් රනිල් රාජපක්ෂ පාලනයට සටන් වදින ජනතාවට සහයෝගය ලබා දීම සඳහා හමුදාවට සහ පොලීසියට ආයාචනය කිරීම සහ හමුදාවේ පහල කොටස් හා පොලීසිවල තෝරාගත් නියෝජිතයන්ගෙන් සමන්විත කමිටු ගොඩ නගමු.**
- **ලාංකීය ජනතා අරගලය පෙරට ගෙන යාම සඳහා දකුණු ආසියානු රටවල ජීවත්වන වැඩ කරන ජනතාවගේ සහයෝගය ලබා ගනිමින් සමාජවාදී කලාපීය බලයක් සඳහා සටන් වදිමු.**
- **දකුණු ආසියානු සමාජවාදී සමූහාණ්ඩුවක් සඳහා සටන් වදිමු.**

**ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය**



# ඉතිහාසයේ සන්ධිස්ථානයක් සලකුණු කළ 2022 මාර්තු-ජූලි

# අරගලයේ පාඩම්..

> අපට ධනේශ්වර ආර්ථික හා ප්‍රජාතන්ත්‍රවාදී සීමාවන් ක්ෂණිකව අතික්‍රමණය කළ නොහැකිය- එහෙත් එම සීමාවන් සාපේක්ෂව පුළුල්කර ගැනීමේ හැකියාව අප බැහැර නොකරමු- එම සීමාවන් තුළ නිර්ධන පංතියේ උවමනාවන් වෙනුවෙන්, ඔවුන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් හා අනාගත පූර්ණ ජයග්‍රහන සඳහා බලවේගයන් සූදානම් කිරීම පසුකරවන තත්වයන් වෙනුවෙන් අපට අරගල කළ හැකිය, එසේ කළ යුතුය..

**මහේෂ් දේවප්‍රිය**

2022 වසර ඉතිහාසයට එකතු වන්නේ ජනතා ඡන්දයකින් තේරීපත් වූ ජනාධිපති වරයෙක් හා ආණ්ඩුවක් පලවා ඇරීමට ජන අරගලයකින් හැකි වීමය . දීර්ඝ කාලයක් තිස්සේ රට තුළ ගෙඩ නැගී තිබූ දූෂිත අත්තොනෝමතික මර්දනකාරී ජන පීඩක මජර ආණ්ඩුකරණයට එරෙහිව පැන නැගුන අරගලයක් ලෙස එය විද්‍යා මාන වේ. මේ අරගලය සඳහා ඒකරාශී වූ ජනතා බලවේගවලින් හඬනගා කියා පැවේ අල්ලස හා දූෂනය පිටු දකින ප්‍රජාත්‍රන්තවාදි ආණ්ඩුකරණයක් අවශ්‍ය බවයි . එකී අරගලයේ සමස්ත හරය ලෙස එය සටටහන් කල හැකි බවයි . සමාජ ක්‍රමයේ බරපතල වෙනස්කමක් ගැන (system change) අරගල බිමෙන් හඬ නැගුනත් මෙය සමාජ ක්‍රමයේ බලපතල සංශෝධනයක් මිස සැබෑ පරිවර්තනයක් නම් නොවේ.

කෙසේ නමුත් සුවිශේෂ වු අරගලයකින් පසු අද වන විට පවතින තත්ත්වය ඉතා වේදනාකාරී වූත් ,අම්හිරි වුත් තත්වයකි. ජනතා බලයෙන් පන්නා දැමූ ඒකාධිපති රාජපක්ෂ පවුල මුල් කර ගත් දූෂිත ජනතා ද්‍රෝහී පාලන රෙජිමය විවිධ වෙට්ටු හරහා නොයෙකුත් රූපකයන් ආදේශ කරමින් කිසියම් ආකාරයකට බලය ස්ථාපිත කර ගැනීමට සිදුකළ හැකි සෑම කූට උපක්‍රමයක්ම භාවිතා කරමින් සිටී. අද වන විට අරගලයේ නියුක්ත්ව සිටි ප්‍රමුක ක්‍රියාකාරීන් රාජ්‍ය මර්දනයේ හස්තයට අසුකරමින් සිටින අතර ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත වැනි ඉතා දරුණු මර්දන, අණපනත්ද භාවිතා කරමින් සිටී. ඒ පාලක ජුන්ටාව ප්‍රකාශ කරන නීතිය, සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය රටතුළ ස්ථාපිතකරලීම සඳහාය.

මෙම දරුනු මර්දණයට එරෙහිව තැන තැන පැන නගින අරගල මතු වූවත් තවමත් සංයුක්ත පලල් අරගලයක් මතුවන බවක් නොපෙනේ. පාර්ලිමේන්තුව නියෝජනය කරන සාම්ප්‍රදායික පාර්ලිමේන්තුවාදි විපක්ෂයේ පක්ෂ හා කණ්ඩාම් ද පාර්ලිමේන්තුව තුළ පුහු වීරයන් වීමට උත්සා කරනවා විනා මහජන සහයෝගීත්වයෙන් සිදුවන වීදි අරගලය ක්‍රමය ගැන උත්සුක වන බවක් නොපෙනේ . ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කය වී ඇත්තේ කෙසේ හෝ පාර්ලිමේන්තුව විසුරුවා හැරගෙන ඊලඟ පාලන කණ්ඩායමක් බවට පත් විමේ ප්‍රයත්නයක් බව පැහැදිලිය. අනුප්‍රාප්තික ජනාධිපති වරයා ලෙස කටයුතු කරන රනිල් වික්‍රමසිංහ යනු දරුනු මර්ධන ඉතිහාසනට හිකම් කියන පුද්ගයකු බව අපි කවුරුත් දනිමු.

රනිල් නායකත්වය දෙන එක්සත් ජාතික පක්ෂය යනු අද වන විට 2% ක පමණ ඡන්ද ප්‍රතිශතයක් ඇති ඉතිහාසයේ මැකීයන තත්වයට පත්ව ඇති පක්ෂයකි. එම නිසා රනිල් වික්‍රමසිංහට ඇදුනු මෙම ලොතරැයියෙන් උපරිම කාල සීමාවක් රැදීසිටීමට ඔහුට කලහැකි හැම දෙයක්ම කරන බවට කිසිදු දෙගඩියාවක් තබා ගත යුතු නැත.

ජනතා අරගලය තුළින් තම ජනාධිපතිවරයා ආණ්ඩුවක් අහිමි නිසාම ජනතාව කෙරේ බද්ධ වෛරයකින් පෙලෙන පොහොට්ටු පක්ෂය රනිල් යොදා ගනිමින් උපරිම මර්දනයක් දියත් කර ගැනීමට සිය උපරිම සහයෝගය ලබා දෙමින් සිටී. රනිල් රාජපක්ෂලාට වටින්නේ මෙම හේතුව නිසා මිස ඔවුන් ප්‍රකාශ කරන ප්‍රජාත්‍රන්තවාදය, නීතිය, සාමය ස්ථාපිත කිරීමට නොවන බවට අරගලකාරී නමුත් බොරු විගඩම්කාරී ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් ගැන කතා කරන සියලු දෙනාත් අවබෝධ කරගත යුතුයි.

කෙසේ නමුත් අද රට තුළ පවතින ආර්ථික තත්වය අතිශය භයානකය. ඉදිරි මාසවලදී මෙය තවත් වැඩි වනාවා මිස අඩුවීමක් නැති බව සියලු ආර්ථික දත්ත මඟින් පෙන්වා දෙමින් සිටී. රටේ දරුවන් විශල ප්‍රතිශතයක් මන්දපෝෂනයට ගොදුරු වී සිටී . ජනතාවගෙන් 1/3 ක් උග්‍ර ආහාර අහේනියක පසු වන අතර ජනතාවගෙන් 80% ක් එක් කෑම වේලක් හෝ අත් හරිමින් සිටින බව ලෝක බැංකු ඇතුලු ජාත්‍යාන්තර සංවිධාන දැනටමත් පෙන්වා දී අවසන්ය. ආහාර උද්ධමනය 95% ඉක්මවා ගොසිනි. විදුලි, ජලය, දුරකථන ඇතුලු සෑම සේවාවක්ම වැඩි වන්නේ මිනිසාට දරාගන්නා විනා හිතා ගන්නවත් බැරි මට්ටමකින්ය. අති විශාල බදු කන්දක් මහජනයා මත පටවා ඇති අතර එය ඉදිරියට තව තවත් ඉහල යාම කිසි විටකත් නොවැලක්විය හැකිය. ශ්‍රී ලංකාව දැනටමත් බන්කොලොත් රජයක් බවට ජාත්‍යන්තරය විසින් පිළිගෙන ඇති තත්වයක් තුල ලංකාවට ආයෝජනය ගාලා ඒමක් ගැන සිතිමට අපහසුය .

මෙම සියලු තත්වයන් හමුවේ වැඩි වශයෙන්ම පීඩාවට පත්වන්නේ නිර්ධනීන් හා දුප්පතුන්ය. ඔවුන්ට සිය ජීවන අරගලය ඉදිරියට ගෙන යාම සඳහා දැනටමත් මාරාන්තික සටනක යෙදී සිටින අතර ඉදිරියේදී මෙම පිරිස මරාගෙන මැරෙන සටනක අවතීර්න වීම කිසිවෙකුටත් නැවැත්විය නොහැකිය . රාජ්‍ය සේවකයන් 80% වැඩි ප්‍රතිශතයක් ඉතා සුළු වැටුපක් ලබන ශ්‍රේණිවලට අයත් වන අතර අද වන විට ඔවුන් නම්බුකාර හිගන්නන් බවට පත් වී සිටිති. කර්මාන්ත, ආයෝජන බිදවැටී ඇති තත්වයන් හමුවේ තරුණ ජනයා හට රැකියාවක් සොයා ගැනීම අතිශයින් අමාරු වන අතර ඔවුන් ආණ්ඩුව සමඟ නොනැවතින අරගලයකට පිවිසීම කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණි.

අද රට ගමන්කරමින් පවතින තත්වය තුළ මුලු රටම සටන් බිමක් බවට පත්වන දිනය වැඩි ඈතක නොවේ. අරගලයේ දෙවන අදියර ලෙස සැලකිය හැකි මෙම අවදියේ ප්‍රධානම සටන් කරුවන් බවට පත්වන්නේ කම්කරුවන් ,ධීවරයින් ,ගොවියන් ඇතුලු නිර්දනයින් හා දුප්පතුන්ය. බඩගින්නට එරෙහිව මතුවන මෙම සටන පීඩිත පංතියේ පාලක කොටස් අතර මතුවන පංති අරගලයේ තියුණු අවස්ථාවක් වනු නිසැකය. ඊළඟ අරගලය බඩගින්නට එරෙහිව පීඩිත ජන කොටස් වලින් පැන නඟින එකක් වන හෙයින් එය ලේසියෙන් නැවැත්විය හැකි එකක් නොවනු ඇති බව මහජන බැංකු අධිපතිවරයා මේ රටේ පාලකයන්ට දැනටමත් අනතුරු අඟවා අවසන්ය . නව ලිබරල්වදි ආර්ථික ප්‍රතිපත්ති මේ වනවිටත් ලෝක පරිමාණව අර්බුදයකට ලක් වී ඇත. මෙම වසරේ මැද භාගය වන විට යුරෝපය පුරාම විශාල ආර්ථික අර්බුදයක් ඇතිවන බවත් එය නොදියුනු ලෝකයේ රටවලට විශාල ලෙස බලපාන බවත් ලෝක බැංකු සභාපති වරයා දැනටමත් අනතුරු අඟවා අවසන්ය. මෙවැනි පසුබිමක ලංකාවේ ධනපති පංතියට කළහැකි කෙන්ගෙඩියක් නැත.

ලංකාවේ ධනපති පංතිය අතිශයින්ම පසුගාමී වේ. ධනේශ්වර ප්‍රජාත්‍රන්ත්‍රවාදයද ඔවුන්ට ලබාදිය නොහැකිය. රටතුළ මතුවන සැම ප්‍රශ්නයකටම ඔවුන්ගේ විසදුම් වන්නේ මර්දනය, රැවටීම, ජාතිවාදය, ආගම්වාදය, ඇවිස්සීම වැනි අතිශය ප්‍රාථමික උපක්‍රම පමණක් බව 74 වසරක ඔවුන්ගේ පාලනයක් විසින් හොඳටම පෙන්වා දී අවසන්ය.

මෙම තත්වය හමුවේ රට තුළ සිටින සමාජවාදී බලවේග මෙන්ම බුද්ධිමත් හා අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී කොටස්වලටත් සිය දෙවුරමත පැවරෙන වගකීම අති විශාලය. මෙය නිවැරදිව කියවා ග

8 වන පිටුවට

# ටීඑන්ඒ - රනිල් සාකච්ඡා දෙමළ ජනතාව රැවටීමක් ද?

කක්කුස්සි ගිහින් පස්ස හෝදන්නෙත් නැති සුද්දන්ගෙන් අපට උපදෙස් හෝ ආධාර උපකාර අවශ්‍ය නැහැ..” කියල ලංකාවේ අගමැතිවරයෙක් වී සිටි රත්නසිරි වික්‍රමනායක වරක් පැවසුවා. මෙහෙම කිව්වේ ගජරාමෙට යුද්ධය යන “දේශප්‍රේමේ ” උස්මුරුත්තාවට ගහපු කාලයක. නමුත් දැන් ලංකාව යන්නේ “දේශප්‍රේමේ” අංශක 360 ක් අනෙක් පැත්තට.

විදේශිකයන් සහිත නැවක් එනවා නම් පිකටින්, පෙළපාලි කරන්න දෙන්නේ නැහැ. හෝටල්වල කෝකියෝ, සංචාරක ව්‍යාපාරයේ රැකියා කරන්නන් පොලිසිය බලා සිටියදීම උද්ඝෝෂකයන්ට බැන පහරදී එළවා දමනව. එහෙම එලවන ගමන් ඔවුන් කියන්නේ “කීයක් හරි අපට හම්බකර ගන්න තියෙන එක මුන් විනාස කරනව” කියල. මේ යන විදියට ලක්ෂ්මී බායි කලාකාරිණියගේ “පිට දීප දේශ ජය ගත්තා” කියන ගීතය තහනම් කරත් පුදුම වෙන්න දෙයක් නැහැ. මොකද එහි එක් තැනක තිබෙනවා “කන්ට අඳින්ටා පිට රටින් එනතුරු මුහුදට දත නියවන්නා” කියල.

සමාජයේ පහළ තලයේ මෙසේ සිදුවෙද්දී ඉහළ තලයත් ඊට දෙවැනි නැහැ. විදේශික ණය ගන්නේ කොහොමද, සංචාරකයෝ ගෙන්වා ගන්නේ කොහොමද, රාජ්‍ය දේපළ විදේශික කොම්පැණිවලට විකුණන්නේ කොහොමද කියන තර්කයේ සිට තමයි ජනාධිපති ඇතුළු ආණ්ඩුව “රට ගොඩ ගන්න” සියලු සැලසුම් හදන්නේ. “ගොඩයන න්‍යායාචාර්යවරුන්ගේ” සිට බොහෝ සාකච්ඡා, වාද විවාද යන්නේත්



ගිනිබත් කළ යාපනය පුස්තකාලය

එලෙසම තමයි.

උතුරේ සමහර මහජන නියෝජිතයන්ද මෙයට වඩා වෙනසක් නැහැ. අහවල් එක දැන් වැටේවි, දැන් වැටේවි කියමින් එළුවෙක් පස්සේ කවුදෝ ගියා කියන්නාසේ ලංකාවේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න කියල ජාත්‍යන්තර බලවතුන් පසු පස්සේ ගාටන එක තමයි කරන්නේ. යුද්ධය හමාර වී වසර 13 ක් තිස්සේ මෙසේ පසුපස ගියත් සිංහල,බෞද්ධ ධනපති ආණ්ඩුවේ හමුදාවන්ගේ දඬු කඳට තව තවත් හිර වුනා මිස ලැබුණු බුරුලක් නැහැ. ජාත්‍යන්තර බලවතුන්ගේත් මීක් හඬක් නෑ.

එසේ තිබියදී ජනාධිපති රනිල් නැවත කරළියට ගෙනවිත් තිබෙන ‘දෙමළ පක්ෂ සමග සාකච්ඡා’ පිළිබඳව දෙමළ ජාතික සංධානයේ (TNA) නායක ආර්. සම්බන්ධන් මන්ත්‍රීවරයා ඉන්දියාවේ “ෆ්‍රන්ට්ලයින්” සඟරාවට පවසා ඇත්තේ ලංකාවේ ජාතික ප්‍රශ්නයට විසඳුම ජාත්‍යන්තර ප්‍රජාවට භාරදිය යුතුයි කියල. සාකච්ඡා මාර්ගයෙන් විසඳුමකට එළැඹීම වේගයෙන් මිරිඟුවක් බවට පත්වෙමින් ඇතැයි පවසා ඇති TNA නායකයා ඇත්ත වශයෙන්ම සිදුවන්නේ උතුරු නැගෙනහිර සිදුකෙරෙන ජන සංයුතියේ සහ සංස්කෘතියේ වෙනස්කම් නිසා ඔවුන්ට සියල්ල අහිමි වෙමින් පැවතීම බවද අවධාරණය කර තිබෙනවා.

තව දුරටත් ජාතික ප්‍රශ්නය අරභයා කරුණු පැහැදිලි කර තිබෙන ආර්. සම්බන්ධන් මන්ත්‍රීවරයා කියා තිබෙන්නේ ,

**“..දෙමළ ජාතික ප්‍රශ්නය නිදහස ලැබුණු දා සිට දෙමළ ජනතාව ඒ පළාත් වලට ඉල්ලා සිටියේ ස්වයංපාලනය සහ බලය විමධ්‍යගත කිරීමය. දෙමළ ජනතාව නිදහස දිනා ගැනීමට උදව් කළෝය. 1957 බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුමේත්, 1987 ඉන්දු ලංකා ගිවිසුමේත් පදනම වුනේ එයයි. දෙමළ ජනතාවගේ අනන්‍යතාව, භූමි ප්‍රදේශය සහ ස්වයං තීරණයේ හෙවත් තමන්ගේ ඉරණම තීරණය කිරීමේ අයිතිය සඳහා වන සැකසුමට ප්‍රතිපාදන ඒ දෙකේම අඩංගු විය. අවාසනාව නම්, ශ්‍රී ලංකා ආණ්ඩුව එම ගිවිසුම් උල්ලංඝනය කිරීමයි..”**


කවර දේශපාලන පක්ෂයකට අයත් වුවත්, සිංහල දේශපාලකයන්ගේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ දෙමළ විරෝධී ස්ථාවරයක් සඳහා සිංහල ජනතාවගේ සහයෝගය ලබා ගැනීම බව පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරයා පවසා තිබෙනවා.

**“..මෙය කෙරීගෙන යනතාක් කල් කිසිවක් සිදුකළ නොහැක. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) සහ ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (ICESCR) ශ්‍රීලංකාවත් හවුල් පාර්ශවයකි. මේ සම්මුති දෙකින්ම ජනතාවගේ ස්වයං තීරණයේ අයිතිය සලසා දී තිබේ..”**

**“..අපට කිසිම ආකාරයකින් රට කැඩීමට අවශ්‍ය නැත. අප පෙනී සිටින්නේ නොබෙදුණු ශ්‍රී ලංකාවක් වෙනුවෙනි. ඒ සමගම අපට දිගටම මෙලෙස යා නොහැක. ප්‍රශ්නය ගැන හොඳාකාර දන්නා ජාත්‍යන්තර ප්‍රජාව කෙරේ යොමුවීම හැර අපට විකල්පයක් නැත. උතුරු නැගෙනහිර සම්බන්ධයෙන් කිසියම් සැකැස්මක් තිබිය යුතුය. ඉන්දියාව, එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාවේ වගකීම වන්නේ පෙරමුණ ගෙන උතුරු නැගෙනහිර සඳහා වන සැකැස්මක් වෙනුවෙන් බලපෑම් කිරීම..” යි.**

යනුවෙන් ඔහු තම පක්ෂයේ ස්ථාවරය දක්වා තිබෙනවා.

මෙතුවක් කල් කරන ලද බලපෑම් හමුවේ ජාත්‍යන්තර ප්‍රජාව ජාතික ප්‍රශ්නයට විසඳුමක් දෙන්න කියල ආණ්ඩුවලට දැනෙන බලපෑමක් කරලා නැහැ. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් වාර්තාවෙත් කියලා තියෙන්නේ ශ්‍රී ලංකාවේ හැමෝම නියෝජනය කෙරෙන සාකච්ඡා පවත්වලා දේශපාලන අධිකාරය විමධ්‍යගත කරන්න කියලා විතරයි. ජිනීවා නුවර සම්මත කරගත් යෝජනාවේ තියෙන්නේ **“ප්‍රාන්තවලට බලය විමධ්‍යගතකිරීම සම්බන්ධ දේශපාලන එකඟතාවකට එන්න”** කියන දියාරු ඉල්ලීම. ඒකෙනුත් වැඩේ බාර දීලා තියෙන්නේ ආණ්ඩුවේම ගොඩ වෙද්දුන්ට.



ලංකාවට එන ජාත්‍යන්තර බලවතුන්, ලංකාවේ තානාපතිවරුන් ජනාධිපතිගේ ඒජන්තයා වන ආණ්ඩුකාරවරයා මොන තරම් නම් හමුවෙලා තිබෙනවද? ඒ අතර දෙමළ මහජන නියෝජිතයන් හමුවෙන්න අමතක කරන්නේ නැහැ නේද? ඒත් ලැබුණු ප්‍රතිඵලයක් කෝ?

එනිසා දැන්වත් දෙමළ මහජන නියෝජිතයන් තේරුම් ගතයුතු වෙනවා ජාත්‍යන්තර ප්‍රජාව වැඩියෙන් කන් දීලා තියෙන්නේ ආණ්ඩුවලට මිස පීඩිත ජාතීන් ගේ ප්‍රශ්නවලට නෙවෙයි කියන කියල. එනිසා තව දුරටත් සෙක්කුවේම යන්නේ නැතිව විකල්පයක් බැලුවොත් හොඳයි නේද?

දෙමළ ජාතික සංධානයේ නායකයා එලෙස අදහස් ප්‍රකාශ කරද්දී එම සංධානයේ මාධ්‍ය ප්‍රකාශක එම්.සුමන්දිරන් මන්ත්‍රීවරයා “සන්ඩේ ටයිම්ස්” පුවත්පතට ප්‍රකාශයක් ලබාදීල තිබෙනව.

**“..සංහිඳියාව සම්බන්ධ සාකච්ඡා දෙසැම්බර් 11 කොළඹදී පැවැත්වෙනවා. අපි කිසිම කොන්දේසියක් ඉදිරිපත් කරන්නේ නැහැ. කෙසේ වෙතත්, රාජ්‍යය විසින් පුද්ගලික ඉඩම් අත්පත් කරගැනීම හා උතුරු නැගෙනහිර පළාත්වල හමුදාව සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. ඒ වාගෙම උපරිම ලෙස බලය විමධ්‍යගත කිරීම සඳහා ව්‍යවස්ථාවේ කළ යුතු වෙනස්කම් ගැනත් අපි යෝජනා කරලා තියෙනවා. ෆෙඩරල් ක්‍රමයක් යටතේ ස්වයං තීරණය නිරවුල් කිරීමක් සහ ඉක්මනින් පළාත් සභා ඡන්දය පැවැත්වීමත් අපි යෝජනා කරලා තියෙනවා..”**

සුමන්දිරන් මන්ත්‍රීවරයාගේ මේ ප්‍රකාශය ඉතා ව්‍යාකූලයි. දෙසැම්බර් 11 කොළඹදී පැවැත්වෙන්නේ සංහිඳියාව සම්බන්ධ සාකච්ඡාවක්ලු. කැරලිකරුවන් ඇතුළු ලක්ෂ එකහමාරක් පමණ ඝාතනය කරල දැන් සංහිඳියාව ගොඩනගල නේද තිබෙන්නේ. උතුරේ ජනතාව දකුණටත්, දකුණේ ජනතාව උතුරටත් යන එනව. මැතිවරණ පවත්වලා ජනතා නියෝජිතයෝ පත්වෙලා ඉන්නව. මෙවර අයවැයට දෙමළ ජාතික සංධානය පක්ෂව හෝ විපක්ෂව චන්දය පාවිච්චි කළෙත් නැහැ. (08 වැනිදා නම් විරුද්ධව ඡන්දය දුන්නා) වසර පනහක් පිරුනු ජනාධිපති රනිල් ගේ නීතිඥ දිවියේ සාදයට මුදල් ගෙවා සම්බන්ධන් හා සුමන්තිරන් මන්ත්‍රී දෙපල සහභාගී වී තිබුන. ආණ්ඩුවම හදලා තියෙන්නේ අලියයි පොහොට්ටුවයි පූට්ටු කරලා. ඉතින් මෙයට වඩා තව මොන සංහිඳියාවක්ද?

ඔහු කියන ලෙස යෝජනා කීපයක් ඉදිරිපත් කරලා තිබෙනව. ඒවා කොන්දේසි නොවේ. කොන්දේසි නොවේ නම් ඒවා දෙමළ ජනයා රැවටීමේ සැරසිළිද? එසේනම් සාකච්ඡා ආරම්භ කරන්නේ කුමන මාතෘකාවක් මුල් කරගෙනද? න්‍යාය පත්‍රය කුමක්ද? දෙමළ ජාතික සන්ධානයට අනුව මේක තවත් පඩික්කම් පුරවන, මුදල් නාස්තිකරන කතා සරිත් සාගරයක් පමණක්ද? සාකච්ඡා සඳහා කල් මරමින් ආණ්ඩුවට අනියමින් සහයෝගයක් ලබාදීමක්ද? මෙවැනි බරපතල ගැටළු රාශියක් TNA මාධ්‍ය ප්‍රකාශක සුමන්දිරන් මන්ත්‍රීවරයාගේ ප්‍රකාශයෙන් මතුවෙනව.

එවැනි ගැටළුකාරී තත්වයක් මතුවෙන්නේ නිකම්ම නොවේ. උතුරු නැගෙනහිර නියෝජනය කරන තවත් දෙමළ මහජන නියෝජිතයන් ජනාධිපති ගේ බලය බෙදීමේ ප්‍රකාශය මුල් කරගනිමින් පළකර ඇති අදහස් දැක්වීම් නිසා.

ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලෙස දිස්ත්‍රික් සංවර්ධන සභා සුදුසුයි කියල මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයා පසුගිය දවසක පාර්ලිමේන්තුවේදී කිව්ව. ජනාධිපතිවරයාත් කිව්ව ඒ ගැන සලකා බලන්න සූදානම් කියල. මේ කතාවට නැගෙනහිර පළාත නියෝජනය කරන මන්ත්‍රී ගෝවින්දන් කරුණාකරන් පාර්ලිමේන්තුවේදී පිළිතුරක් දීල තිබෙනව.



සෙල්වම් අඩෛයික්කලනාදන්

ඔහු කියන ලෙස යෝජනා කීපයක් ඉදිරිපත් කරලා තිබෙනව. ඒවා කොන්දේසි නොවේ. කොන්දේසි නොවේ නම් ඒවා දෙමළ ජනයා රැවටීමේ සැරසිළිද? එසේනම් සාකච්ඡා ආරම්භ කරන්නේ කුමන මාතෘකාවක් මුල් කරගෙනද? න්‍යාය පත්‍රය කුමක්ද? දෙමළ ජාතික සන්ධානයට අනුව මේක තවත් පඩික්කම් පුරවන, මුදල් නාස්තිකරන කතා සරිත් සාගරයක් පමණක්ද? සාකච්ඡා සඳහා කල් මරමින් ආණ්ඩුවට අනියමින් සහයෝගයක් ලබාදීමක්ද? මෙවැනි බරපතල ගැටළු රාශියක් TNA මාධ්‍ය ප්‍රකාශක සුමන්දිරන් මන්ත්‍රීවරයාගේ ප්‍රකාශයෙන් මතුවෙනව.

එවැනි ගැටළුකාරී තත්වයක් මතුවෙන්නේ නිකම්ම නොවේ. උතුරු නැගෙනහිර නියෝජනය කරන තවත් දෙමළ මහජන නියෝජිතයන් ජනාධිපති ගේ බලය බෙදීමේ ප්‍රකාශය මුල් කරගනිමින් පළකර ඇති අදහස් දැක්වීම් නිසා.

ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලෙස දිස්ත්‍රික් සංවර්ධන සභා සුදුසුයි කියල මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයා පසුගිය දවසක පාර්ලිමේන්තුවේදී කිව්ව. ජනාධිපතිවරයාත් කිව්ව ඒ ගැන සලකා බලන්න සූදානම් කියල. මේ කතාවට නැගෙනහිර පළාත නියෝජනය කරන මන්ත්‍රී ගෝවින්දන් කරුණාකරන්

පාර්ලිමේන්තුවේදී පිළිතුරක් දීල තිබෙනව.

**“..ජනාධිපතිට ඕනෙම නම් දිවයිනේ දකුණු පළාත්වලට දිස්ත්‍රික් සංවර්ධන සභා දාගන්න. හැබැයි දෙමළ ජනතාව ඉල්ලන්නේ ඒකාබද්ධ උතුරු නැගෙනහිරක් සමග ෆෙඩරල් ක්‍රමයට බලය බෙදාගැනීමක්..”** යි කියලා. දිස්ත්‍රික් සංවර්ධන සභා නම ඇහෙන විට ඒ අයගේ හිගඩු පිපෙනව ඇති අතීතය මතක් වෙලා. ජනාධිපති රනිල්ද අමාත්‍ය ධූර දැරූ ජේආර් රජයේ 1983 ජුනි 14 දා දිස්ත්‍රික් සංවර්ධන සභා චන්දයට යාපනයට ගිය ගාමිණී දිසානායක හා සිරිල් මැතිව් පිරිවරාගත් මැරයන් තමයි යාපන පුස්තකාලයට ගිනි තැබුවේ.

ඉතිහාසයේ මෙවන් වූ සියලු අත්දැකීම් ආවර්ජනය කරමින් දෙමළ ජාතික ජනතා පෙරමුණේ නායක ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් පවසන්නේ උතුරු නැගෙනහිර දෙමළ මහජන නියෝජිතයන්ට මෙවර ජනවරමක් ලැබුනේ ජාතික ප්‍රශ්නයට ෆෙඩරල් විසඳුමක් ලබා ගැනීම වෙනුවෙන් කියල. දෙමළ ජනතාවගේ ජාතික ප්‍රශ්නයට කිසිම දිනක ඒකීය රාජ්‍යයක් තුළ නම් විසඳුමක් නොලැබෙන බව ඔහු දැඩි අධිෂ්ඨානයෙන් යුතුව කියනව.

එබැවින් දෙමළ මහජන නියෝජිතයන් සමඟ යෝජිත11 දා සාකච්ඡාව ෆෙඩරල් පාලනයක් සඳහා බව උතුරටත්, දකුණටත් නොසඟවා ජනාධිපතිවරයා පැවසිය යුතුයි කියලත් ඔහු යෝජනා කරනව. එසේ නොකරන්නේ නම් ජනාධිපතිවරයා කරන්නා වූ මේ ඇරයුම I M F ණය ලබා ගැනීමේ ගේ කූඨ උපායක් කියලයි පොන්නම්බලම් මන්ත්‍රීවරයා චෝදනා කරන්නේ.

දෙමළ ජනයාගේ අභිලාෂයන් සම්පූර්ණ වීමට නම් උතුරු- නැගෙනහිර පළාත් ඒකාබද්ධව පැවතීම වැදගත් යැයි පාර්ලිමේන්තු මන්ත්‍රී සෙල්වම් අඩෛයික්කලනාදන් තමිල් ඊළාම් විමුක්ති සංවිධානයේ (TELO) නායකයා කියා තිබෙනව.

උතුරු පළාත් සභාවේ හිටපු මහ ඇමති සී.වී. විග්නේශ්වරන් උපහාසාත්මකව පවසා තිබුනේ මාරුවෙන් මාරුවට බලයට පැමිණි සෑම ආණ්ඩුවක් සමඟම දෙමළ නායකයන් වෙහෙසට පත්වෙන තෙක් සාකච්ඡා කළා කියල. කොච්චර කතා කළත් මෙතෙක් කිසිම දෙයක් වුනේ නැහැ කියලත් විග්නේශ්වරන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා කරුණු සහිතව පෙන්වා දී තිබෙනව.

මෙලෙස වික්‍රමසිංහ ජනාධිපතිවරයා ගේ යෝජිත සාකච්ඡාව පිළිබඳ යම් හෝ සුභවාදී බලාපොරොත්තුවක් තබාගෙන සිටින්නේ මන්ත්‍රී සුමන්දිරන් පමණයි. අනෙක් දෙමළ ජන නායකයන් අබමල් රේණුවක තරමින් හෝ විශ්වාසයක් පළ නොකරද්දී ජනාධිපතිගේ මාමා ගේ පුවත්පත නම් සුබ මොහොතින් දකුණේ වැඩ අල්ලලා තිබෙනවා.

දෙසැම්බර් 03 සෙනසුරාදා “ලංකාදීප” පුවත් පත යෝජිත සාකච්ඡාව පිළිබඳ සිය කතුවැකියේ මෙහෙම කියනව. **“..බලය බෙදීම ඇතුළුව ජනවාර්ගික අර්බුදයට ස්ථිරසාර විසඳුමක් ලබාගැනීම වෙනුවෙන් සියලු දේශපාලන පක්ෂ එකඟත්වයකට පැමිණීම සඳහා වන සාකච්ඡාවක් දෙසැම්බර් 11 වැනිදායින් පසුව කැඳවන බව එම ප්‍රකාශයේ සඳහන් විය..”** කියල.


ලංකාදීප මාධ්‍ය මහත්තුරු පළමුවෙන්ම පැහැදිලි කළ යුතු දෙයක් තියෙනවා. සිංහලයා ජාතියක් කියලා සැකෙන් බියෙන් තොරව කියන ගමන් දෙමළ ජනතාව ජාතියක් කියා පිළිගන්න අකමැති ඇයිද කියන එක. මේ බලය බදාගෙන හිදීම නිසා ජාතික ප්‍රශ්නයක් ඇතිවෙලා තියෙනවා කියන එක “ලංකාදීප” කතුවරයා වසන් කරනවා.

**“..මේ රටේ ආර්ථික අර්බුදය විසින් සියලු දේ ගිලගන්නාතුරු වඩාත්ම සාකච්ඡාවට බඳුන් වූ අර්බුදය ජනවාර්ගික ගැටලුව විය. එය ජාතික ගැටලුව වශයෙන් හඳුන්වනු ලැබුවේද එයින් රටේ සෑම ක්ෂේත්‍රයකටම කළ බලපෑම් හේතුවෙනි..”** යි කියා මුළුමනින්ම සාවද්‍ය ප්‍රකාශනයක් කරලා තියෙනවා.

ජාතියක් කියන්නේ හුදු වාර්ගිකත්වයක් පමණක් නෙවෙයි. භාෂාව, ඉතිහාසය වාර්ගිකත්වය, සංස්කෘතිය සහ පාරම්පරික වාසභූමිය ඇතුළු අංගලක්ෂණ තම ජාතික අනන්‍යතාව කොටගත් ජන කණ්ඩායමක්. එතැනදී වැදගත් වන කාරණයක් තමයි සංස්කෘතික බැඳීම්වලට අමතරව දේශපාලන සාමූහිකත්වයක් තිබීම. තම ජාතියට ගැලපෙන දේශපාලන සැකසුම් මෙන්ම තමන්ගේම රාජ්‍යයක් වුව පිහිටුවාගැනීමේ අයිතියක් තිබීම.

1976 වනතුරු රටේ විවිධ පළාත් අනුව බෙදී සිටි දෙමළ ජනයා ඒ දක්වා හැඳින්වූවේ ජනවර්ගයන් කියල. නමුත් 1976 මැයි 05 දා සියලු දෙමළ ජන නායකයන් එකතු වී මහා සමුළුවක් පවත්වමින් දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ බිහිකර ගත්ත. එහි නායකයා ලෙස පත් වුනේ එස්.ජේ.වී. චෙල්වනායගම්.

මේ සමුළුව තුළින් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ ” තමන් තව දුරටත් මේ රටේ ජනවර්ගයක් නොව සිංහලයන් ගෙන් වෙනස් ජාතියක්” ය කියල. **“..මේ රටේ හුදු දෙමළ ජාතියේ පැවැත්ම සඳහා ස්වයං තීරණ ගැනීමේදී ඕනෑම ජාතියකට හිමිවන නෛසර්ගික උරුමය මත නිදහස් ස්වාධීන ආගමික නොවන සමාජවාදී දෙමළ ඊලාම් රාජ්‍ය යළි ප්‍රතිෂ්ඨාපනය කළ යුත්තේ යැයි” එක හඬින් මෙම සමුළුවේදී සම්මත වුනා. “වඩුකොඩ්ඩෙයි සමුළුව..”** නමින් මෙය දෙමළ අරගල ඉතිහාසයට එක්වුණා.



තමන් හඳුන්වා දී ඇති නම භාවිතා කරනවා හැර ” හරක් කටා”, “වම්බොට්ටා”, වැනි අන්වර්ථ නාමයන්ගෙන් හැඳින්වීම් කිරීම මාධ්‍ය අචාර ධර්මවලට පටහැනියි. නමුත් ප්‍රධාන ශීර්ෂපාඨ පවා එලෙස දැමීමට තරම් ඇතැම් මාධ්‍යකරුවන් බලසම්පන්න වෙලා තිබෙනව. විහිළුවනම් මෙවැනි මාධ්‍යවල ප්‍රධාන කතුවරුන් කතෘ සංසදයේත් කෙරුමෝ. නමුත් ඔවුන් මතක තබා ගත යුතුයි පත්තරේ ඔවුන් ගේ වුනාට දෙමළ ජාතිය ඔවුන් ගේ නොවේ කියල.

වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ බලය බෙදීමේ සාකච්ඡා වේ දිග පළල මොනවට හෙළිදරව් කරමින් මාමාගේ පත්තරේ කතුවැකිය තව දුරටත් මෙහෙම කියනව.

**“..විසඳුමක් සොයා ගැනීම සඳහා අවංක කැපවීමක් කිරීමට කැමැති දේශපාලන පක්ෂ මුලින්ම කළ යුත්තේ ජනවාර්ගික ගැටලුව දේශපාලන බලය ලබාගැනීමේ සටන් පාඨයක් බවට පත්කර ගැනීමෙන් වැළකීමය..”**

හොරාට ඉස්සර කෙහෙල් කැන වැට පැනල තිබෙන්නේ. ඉතා පැහැදිලිවම මේ කියන්නේ දෙමළාට, ජාතියක් ලෙස දේශපාලන බලය ඉල්ලන්නේ නැතිව දෙන දෙයක් කාලා වෙන දෙයක් බලාගෙන ඉන්න කියලා.


මේ උපදේශයට අනුපාන ලෙස වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ 50 සපිරූ නීතිඥ දිවියේ සාදයේ ස්තුති කතාකරුවාත් ගන්න පුළුවන්. ඔහුගේ නම කුෂාන් ද අල්විස්. මේ නීතිඥවරයා දෙමළ ජනතාවට බලය බෙදීම නොව කිසිඳු බලයක් නොමැති පළාත් සභාවන්ටද බරපතල විරෝධය දක්වන්නෙක්. උග්‍ර දෙමළ විරෝධියෙක්.

සාදය ආරම්භ වීමට පෙර පැවති උත්සව සභාව අමතමින් රනිල් ජනාධිපතිවරයා එක්සත් ශ්‍රීලංකාවක් ගොඩනැඟීමට නීතිඥයන් ඇතුළු වෘත්තිකයන්ගේ සහය ඉල්ලා සිටිද්දී සිංහල බෞද්ධ ජාතිවාදී කුෂාන් ද අල්විස් නීතිඥවරයාට ස්තුති කතාව දීම විමතිය දනවන්නක් බව බොහෝ නීතිඥයන් කියනව.

ඉතින් මේ සියල්ලෙන් විද්‍යමාන වන්නේ වසර 72 ක් තිස්සේ නොකෙරෙන වෙදකමට කෝදුරු තෙල් හත්පට්ටයයි තවත් ටිකක් හෙව්වා කියන්නා වගේ මෙවරත් කෝදුරු තෙල් හොයා ගැනීමට නොහැකිවන බවයි. හැබැයි ලබන ජනාධිපතිවරණයේදී රනිල් වික්‍රමසිංහ ජනාධිපති අපේක්ෂකයාගේ මැතිවරණ ප්‍රකාශනයේ බලය බෙදීම පිළිබඳ විශේෂ වගන්තියක් ඇතුළත් විය හැකි බවත් ඉන්තේරුවෙන්ම කියන්න පුළුවන්. ■

ඥාණසිරි කොත්තිගොඩ

# ගෝඨාභය විශ්‍රාමිකයෙක් ද?



ජේ. ප්‍රේමලාල්

ශ්‍රී ලංකාවේ හත්වන විධායක ජනාධිපතිධූරය දරමින් සිට ශ්‍රී ලංකා ජනතාවගේ අප්‍රසාදයට ලක් වී රටින් පැන යාමට සිදුවන ජනාධිපතිවරයා වශයෙන් ගෝඨාභය ලෝක ප්‍රසිද්ධියට පත් විය. විධායක ජනාධිපතිවරයෙකු වශයෙන් නිල කාලය අවසන් වීමට පෙර ධූරය අතහැර දමා ජීවිත ආරක්ෂාව සඳහා හොර රහසේම රට අතහැර දමා විදේශගත වීම, විදේශ රටක සිටිමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායකවරයාට තමුන් ජනාධිපතිධූරයෙන් ඉල්ලා අස්වීම දැන්වීමේ ලිපිය ලැබීමට සැලැස්වීම, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයෙන් ජනාධිපතිධූරයට රනිල් වික්‍රමසිංහ මහතා පත් වීමෙන් පසු ටික දිනකින් පූර්ණ රාජ්‍ය ආරක්ෂාව යටතේ ගෝඨාභය හොරපූසා වගේ දිවඉනට පැමිණීම, එසේ පැමිණීමෙන් පසු හිටපු ජනාධිපති වශයෙන්ද, විශ්‍රාමික ගිය ජනාධිපතිවරයා වශයෙන්ද නම් කරමින් රාජ්‍ය ආරක්ෂාව, නිල නිවාස, කාර්යාල පහසුකම් සහ නිල වාහන යන රාජ්‍ය වරප්‍රසාදයන් ඔහුට රනිල් රජය විසින් සපයා දී ඇත.

මේ වනවිට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්වාධීන කණ්ඩායම්, උත්තර සභාග, විරුද්ධ පක්ෂය හා තවත් කණ්ඩායම් බොහොමයක් සිටියත් පාර්ලිමේන්තුව තුළ ගෝඨාට විශ්‍රාමික භාවයක් ඇත්ද? නැත්ද? යන නීතිමය ප්‍රශ්නය මතු කිරීමට ජනතාවගේ පැත්තෙන් කථා කිරීමට තරම් කොන්දක් ඇති මන්ත්‍රීවරයෙක් නැති තරම්ය.

ගෝඨාභය හත්වෙනි විධායක ජනාධිපති වශයෙන් දිවුරුම් දීමෙන් පසු ගජ මිතුරන්ට බදු සහන ලබා දෙමින් කෘෂිකර්මාන්තය කාබනිකකරණයට ගෙන එමින් වී ගොවියාට යන එනමක් නැති කොට රටේ පරිසරය විනාශ මුඛයට ඇද දමමින් නියෝග නිකුත් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය කඩා වැටීමකට ලක් කරමින් ඩොලර් සංචිත විනාශ කරමින් පවුලේ සහ ගජ මිතුරන්ගේ සුබ විහරණයට අතහිත දෙමින් එසේ කිරීමෙන් මුළු මහත් වූ රට වැසියා වීදි බැස ගෝඨාභය පන්නා දමනතුරුම සටන් කරපු බව අපි කවුරුත් දන්නා නොරහසකි.

දූන් දූන් ජාතික උත්සව වලට හිටපු ජනාධිපති යැයි කියා ගනිමින් උත්සව වලට සහභාග වන බව විද්‍යුත් මාධ්‍ය නාලිකා මගින් දක ගැනීමට සිදු වී ඇත. නමුත් ජනතාව විසින් රටින් පන්නා දැමූ ද්‍රෝහී පුද්ගලයෙකු වශයෙන් නම් කරනු වෙනුවට මේ රටේ ජනතාවගේ මුදලින් තවදුරටත් ගෝඨා යැපීම තවත් විලිලැජ්ජා නැති ක්‍රියාවකි.රටට ජාතික වශයෙන් ප්‍රජාතාන්ත්‍රිකව රට පාලනයෙන් ඔබ්බට ගොස්

තනි පුද්ගල අදහස් මත රට විනාශ මුඛයකට ඇද දැමූ ද්‍රෝහී පුද්ගලයෙක් විනා විශ්‍රාමික ජනාධිපතිවරයෙකු නොවන බව රටේ ජනතාව පිළිගෙන ඇත. ඔහු විසින් කරන ලද ආර්ථික මර උගුලෙන් ශ්‍රී ලංකාවට ගොඩ ඒමට වර්තමාන ජනාධිපවරයාටත්, පාර්ලිමේන්තුවේ 225 ටවත් බැරි බව මේ වනවිට ඔප්පු කොට හමාරයි.

තවද මේ රටේ සිවිල් පුරවැසියෙකු රටට අවුරුදු 40 ක් 45 ක් පමණ කාලයක් සේවය කොට විශ්‍රාම ගිය පසු විශ්‍රාමික වැටුප ක්‍රියාත්මක කරවා ගැනීමට අවුරුදු 02 ක් පමණ කාලයක් ගතවන බව ඔබ අප දන්නා කරුණකි.

අවුරුදු 2 1/2 ක් පමණ සිට ධූරයෙන් පැනගිය මේ ද්‍රොහී පුද්ගලයාට සියළු වරප්‍රසාද රජය මගින් ලබා දී ඇත. මේ ක්‍රමය වෙනස් කරන්නට ඔබට අයිතියක් ඇති බවද, එකී විකල්ප වෙනස්කම් වෙනුවෙන් ඔබ අප සමඟ එක්වන්න. ■

# ඉනිවැට අල්ලා අමුඩ ගැසුවා වගෙයි..

1954 වර්ෂයේ සිට අක්කර 10 කට වඩා වැඩි තේ, පොල්, රබර් මුඩු ඉඩම් කැබලි කිරීමේදී ඉඩම් කැබලි කිරීමේ මණ්ඩලය මගින් අවසර ලබාගත යුතු බවට පනතක් තිබුනලු.

හැබැයි බොලේ දූන් තනි පුද්ගලයෙකුට අක්කර 10 කට වැඩියෙන් ඉඩම් ඇත්තේ දියවන්නාවේ මොන්ටිසෝරියේ බබාලා ඇත්තන්ට පමණක් බව රට්ටු කියනවා. ඉතින් මේ ලගදි ඉඩම් කැබලි කිරීමේ මණ්ඩලය විසින් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල වල ලොක්කෝ ටික ඔක්තෝබර් මාසයේදී කොළඹට කැඳවා අක්කර 10 ට වඩා ඉඩම් කැලි කඩා ලියාපදිංචිය සඳහා භාරදෙන ඔප්පු ලියාපදිංචිය තාවකාලිකව නතර කොට ඉඩම් කැඩීමේ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන එන ලෙස දන්වා සිටින්න කියලා ලොකුවට උපදේශයක් දීලලු.

අපි බැලුවා මොකද බොලේ හිටපු ගමන් ඉඩම් කැබලි කිරීමේ මණ්ඩලයේ ලොකු ලොකු පුටුවල අය නින්දෙන් ඇහැරුනා වගේ පනත වහාම ක්‍රියාත්මක කරන්නෙ කියල. බැලුවහම තමයි වැඩේ තේරෙන්නෙ දූන් කැලි කඩන්න ඉතුරු වෙලා තියෙන ඉඩම් සොච්චමෙන් එළදාවක් ගන්න එපැයි නේද?

ඉතින් මේ අය දන්නෙ නැද්ද හැබැටම ඉඩම් කැබලි කඩන්නෙ මිනින්දෝරු මහත්තුරු කියල. බලන්ඩකෝ ඉතින් මිනින්දෝරු මහත්තයල ඉඩම් මැනල කැලි කඩල ගිහින් පිඹුරුපතක් හදල ඉඩම් අයිතිකාරයට භාර දෙනව. ඉඩම් අයිතිකාරය ඒක පාවිච්චි කරල ඉඩම් කැබැල්ල විකුණනව. ඉඩම් හිමියා එකී ඉඩම විකුණල ගැණුම්කරුගෙන් මුදලුත් අරන් යන්න යනව. ප්‍රසිද්ධ නොතාරිස් මහත්මයා හෝ මහත්මිය ඒ ඔප්පුව ලියා සහතික කරනව. ඔන්න වැඩේ වැරදිච්ච තැන. ඉඩම් ලියාපදිංචි කිරීමේ නිලදරුවන් කියනව මේක ලියාපදිංචි කොරන්නනම් අහවල් අනුමැතිය ගේන්න ඕනෙ කියල නොතාරිස්වරයාට දනුම් දෙනව. නොතාරිස් උඩ ගිහින් බිම වැටෙනව. ඇයි බොලේ ඉඩම වික්ක පුද්ගලය මුදලුත් අරන් යන්න ගිහින්. ලියපු ඔප්පුව ලියාපදිංචි කරල දෙන්න විදිහකුත් නෑ. ඉතින් ඉඩම මිලට ගත්ත පුද්ගලයාට දනුම් දුන්නහම ඒ පුද්ගලය ගාටනව කැබලි කැඩීමේ මණ්ඩලයට අනුමැතිය ගන්න. අනුන්ගෙන් ඉඩම් සල්ලි වලටත් අරන් තවත් වියදම් කරපන්කො ඉතින් අනුමැතිය ගන්න. මණ්ඩලයේ ලොක්කන්ට බැරිද ඉතින් එක සැරේටම මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ඔය නියෝගය පැනවුවානම් වැඩේ ගොඩ නේද? ඉතින් එහම කලොත් මණ්ඩලයේ ලොකු ඇත්තන්ට විශාල පාඩුවක් වෙනව කියල ආරංචියිලු බොලේ. ■

# ASINI VOICE අසනි වොයිස්

https://asanivoice.org

ASANI VOICE යනු ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂයේ නිල වෙබ් අඩවියයි. සෑම ආකාරයකම ධනේශ්වර සූරාකෑමට සහ පීඩනයට එරෙහිව ප්‍රකාශන සහ ලිපි ප්‍රකාශයට පත් කිරීමට අපි කැප වෙමු. අපගේ අපේක්ෂාව වනුයේ විප්ලවවාදී දේශපාලනය පිළිබඳ සැබෑ ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනයක් සැපයීම සහ ලෝක විප්ලවයේ පුළුල් රාමුව තුළ දකුණු ආසියාවේ කම්කරු පන්ති ව්‍යාපාරය සමඟ බද්ධවීමට උත්සාහ කිරීමයි. අපි, වීදිවලත්, වැඩපළවලත් අරගලයේ යෙදී සිටින කම්කරුවන්, ගොවීන් සහ ශිෂ්‍යයන් වන්නෙමු. අපි බහු වාර්ගික, බහු ලිංගික සහ බහු සංස්කෘතික පුද්ගලයින් වන්නෙමු.

මානව වර්ගයාගේ වර්තමාන අර්බුදය, වෙළඳපල සහ තාක්ෂණය මගින් විසඳනු ඇතැයි අපි නොසිතමු. ගැටලුව පවතිනුයේ, ධනේශ්වර ප්‍රාග්ධන සම්මුච්චයත්, එහි නිමක් නැති වර්ධනය සහ එහි අසීමිත නාස්තියත් මත පදනම්වූ සමස්ත පද්ධතිය තුළය.


ප්‍රාග්ධන සමුච්චය හේතු කොටගෙන තවදුරටත් මිනිස් වාසයට සුදුසු ස්ථානයක් නොවන ලෙස පෘථිවි පද්ධතිය විනාශ කරයි. ඒ නිසා අපි ධනවාදය පෙරලා දැමීම සඳහා පෙනී සිටිමු. අද අප ඉදිරියේ ඇත්තේ ම්ලේච්ඡත්වටය එරෙහිව සමාජයවාදය විජයග්‍රහණය සදහා පෙනී සිටීමයි.

මෙම තත්ත්වය තුළ, ASANI VOICE කම්කරු පන්තියට සහ පීඩිත ජනතාවට අදාළ ප්‍රශ්න මෙන්ම ජාතික හා ජාත්‍යන්තර ප්‍රශ්න කෙරෙහිද අවධාරණය යොමු කරයි.

අපි අරගල කරන ප්‍රශ්න වනුයේ:

- ස්වයං නිර්ණය සඳහා ජාතීන්ට ඇති අයිතිය මෙන්ම දකුණු ආසියාවේ කුලවාදයට (කුල ක්‍රමය) සහ ජාතිවාදයට එරෙහි ජනතා ව්‍යාපාරය ගොඩනැගීමටත්,
- ලෝකයේ සමාජවාදී සංවිධාන එකිනෙක සම්බන්ධ කිරීම සඳහා සටන්කාමී පුවත්පත් කලාවක් යෝජනා කිරීමට ASANI VOICE බලාපොරොත්තු වේ.
- තිරසාර සමාජවාදී සමාජයක් ගොඩනැගීමේ කාර්යභාරය අප හමුවේ ඇති බවත්, මිනිසාගේ පැවැත්ම සහ පෘථිවියේ පැවැත්ම රඳා පවතින්නේ එය මත බවත් අපි තරයේ විශ්වාස කරමු.
- අපගේ අරමුණු සහ කාර්යභාරයන්, සියළුම ආකාරයේ ධනේශ්වර, අධිරාජ්‍යවාදී සහ පන්ති සහයෝගීතාවාදී දේශපාලන පක්ෂවලින් ස්වාධීනව පවතින්නකි.
- දේශසීමා, සම්බාධක, රාජ්‍ය මර්දන ක්‍රියා සහ සමස්ත අධිරාජ්‍යවාදී යාන්ත්‍රණයට මෙන්ම, ඒවා හරහා ගොඩනගන සහ අරමුදල් සපයන දේශපාලන පක්ෂවලට අපි විරුද්ධ වෙමු.
- අපගේ අරගලය වන්නේ දකුණු ආසියාවේ එක්සත් සමාජවාදී සමූහආණ්ඩුවක් ගොඩනැගීම මෙන්ම ලෝකයේ සියලුම කම්කරුවන් එක්සත් කිරීම සඳහා විප්ලවවාදී කොමියුනිස්ට් ජාත්‍යන්තරය සඳහා නව ලීගයක් යෝජනා කිරීමයි.
- අපි කම්කරු පන්තිය කෙරෙහි විශ්වාසය තබන අතර කම්කරුවන් සිය සේවා ස්ථානවල සංවිධාන ගත කිරීමෙන් මෙම ක්‍රමය අවසන් කර නව සමාජයක් ගොඩනැගීම සඳහා පීඩිත ජනතාව එක්සත් කළ හැකියයි විශ්වාස කරමු.
- අපි වෘත්තීය සමිති තුළ සහභාගිවී කටයුතු කරන අතරම වෘත්තීය සමිති නිලධාරිවාදයට එරෙහිව සටන් කරන්නෙමු.
- අපි සමාජවාදී ස්ත්‍රීවාදී, පාරිසරික, ජාතිවාදයට එරෙහි ව්‍යාපාර, LGTBQ ප්‍රජාව සහ ලෝකයේ සංක්‍රමණික අයිතිවාසිකම් සංවිධානවල ක්‍රියාකාරී කොටසක් වන්නෙමු.
- බොහෝ විට රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙහෙයවනු ලබන ප්‍රජා නිලධාරිවාදයට එරෙහිව අපි සටන් කරන්නෙමු.

# දේශපාලනයේ ඓතිහාසික අවස්ථා..




ටී.එම්.ප්‍රේමවර්ධණ

ඓතිහාසික අවස්ථා හැමදා ම ඇත්තේ නැත. වරින් වර පැමිණේ. අරගලයත් එවැනි ඓතිහාසික අවස්ථාවකි. ඒ අවස්ථාව වන විට සමාජගත ව පැවති දේශපාලන අදහස් අනුව ජනතාව ක්‍රියා කළහ. නිදසුනක් වශයෙන් අරගලය ප්‍රධාන වශයෙන් සාමකාමී වූයේ එ නිසාය. පාලකයන්ගේ ප්‍රචණ්ඩත්වයට එරෙහි ව ප්‍රතිප්‍රචණ්ඩත්වයක් ඇති වුවත් එය ද ඒ මොහොතට පමණක් සීමා වූයේ එ නිසාය.

නැවතත් එවැනි ඓතිහාසික අවස්ථාවක් පැමිණි විට ඒ අවස්ථාවේ පවතින සමාජගත දේශපාලන අදහස් අනුව ජනතාව ක්‍රියා කරනු ඇත. එහෙත් අරගලයෙන් පසු සමාජගත දේශපාලන අදහස්වල වෙනසක් සිදු වී තිබෙනවා ද? එහෙමත් නැති නම් වෙනස් වෙමින් තිබෙනවා ද? එවැනි වෙනස් වීම් සිදු වී තිබෙනවා නම් ඒ මොනවා ද? මෙවැනි ප්‍රශ්න ඇසීම අතිශයින් වැදගත් වේ. ඒවායින්, ඊ ළඟ ඓතිහාසික අවස්ථාව පැමිණෙන තුරු කළ යුත්තේ මොනවා ද, නොකළ යුත්තේ මොනවා ද කියා දේශපාලන ක්‍රියාකාරීන්ට ඉඟි කරන බැවිනි.

සමාජගත දේශපාලන අදහස් හැඩ ගැසෙන්නේ ජනතාව දේශපාලන වශයෙන් ක්‍රියා කරන විට ඊට ප්‍රතිචාර වශයෙන් පාලකයන් ක්‍රියා කරන ආකාරය අනුවය. ඒ අනුව බැලූ විට අරගලයෙන් පසු තවමත් සමාජගත දේශපාලන අදහස්වල කැපී පෙනෙන වෙනසක් සිදු වී නැති බව මගේ අදහසයි.

එසේ වුව ද අරගලයේ අවසාන අදියරේ සිට පාලකයන් ගෙන

8 වන පිටුවට

# කලු සල්ලි සුදු වෙයි ද..?

ඇහැළියගොඩ නගරයේ මෝරගල ක්‍රීඩාංගණයේ පැවති මහා සංගීත රාත්‍රිය හා කානිවල් ව්‍යාපාරයට මැදිහත් වූ බළල් හස්ථය කවුද යන ප්‍රශ්නය අප ඉදිරියේ පවතී. කිලෝමීටර් 50 කට ආසන්නව මහාමාර්ග වර්ණවත්ව විදුලි ආලෝක කිරීම, මහා බත් දන්සැල, ළමා ක්‍රීඩා හා නොයෙකුත් ක්‍රීඩාවන්ද සහ මහා වේදිකාවක දැවැන්ත සංගීත ප්‍රසංගයක් 20221219 වන දින සිට 2023 0102 දින දක්වා සෑම රාත්‍රියකම මේ මහා සංගීත හා කානිවල් උත්සව පැවැත්වූ අතර මෙහි යට අරමුණ අපැහැදිලිය.

එහෙත් මෙම සැණකෙළියේ අයිතිකරු යැයි කියා ගන්නා ආයුර්වේද වෛද්‍ය තාම්බුගල මහතා පවසා ඇත්තේ ඔහුගේ මහා පරිමාණයේ කෝමාරිකා වගාවේ ආදායමෙන් කොටසක් ජනතාව සතුටට පත් කිරීමේ ඇති අරමුණ බවයි. නමුත් කානිවල් භූමියට ඇතුල් වීමෙන් පසු යම් යම් ක්‍රීඩාවන්ට යම් යම් මුදල් ගෙවා යොමු වීමට අවස්ථාව සලසා ඇත. ශ්‍රී ලංකාව තුළ බොහෝ දේශපාලන බලවතුන් අයථා පරිදි ගොඩගහගෙන සිටින ධනස්කන්ධයන් සුදු සල්ලි බවට පත්කර ගැනීමට මාර්ගයක්ද යන්න ප්‍රදේශවාසීන් සැක කරන බවට විස්තර ලැබී ඇත. තාම්බුගල මහතාගේ ඩොලර් සංචිත සම්බන්ධයෙන් මහ බැංකුව නොදන්නේද?

කෝමාරිකා වගාවකින් මෙවැනි තනි පුද්ගලයෙකුට මහා ධානපතියෙකු වීමේ හැකියාවක් ඇත්නම් ලංකාවේ මුදල් අර්බුධයට කෝමාරිකා යනු ඩොලර් උල්පතකි. කියන්නෝ මොනවා කීවත් අද රට ආර්ථික වශයෙන් කඩාවැටී ඇති අවස්ථාවක මෙවැනි විනෝදාත්මක රාත්‍රී සැණකෙළි පවත්වා කෙරෙන යටි අරමුණ කලු සල්ලි සුදු සල්ලි බවට පත් කිරීමේ ප්‍රෝඩාවක්ද යන්න ජනතාව ප්‍රශ්න කරයි.■

ජේ. ප්‍රේමලාල්

අසනි
495, මාකොළ උතුර, මාකොළ.
Tel: 077 9053016 / 077 7035167
Web: https://asanivoice.org

## කෙටිම කෙටි කතු වැකියක්..!

එළුවකු කරතබාගත් බමුණාට අත්වූ ඉරණම ඔබ
ඕනැතරම් අසා ඇති.
අන්තිමේ වංචාවට බොරුවට අසුවී තම එළුවා
අහිමි කරගත් හැටිත් ඔබ දනිතියි සිතමි.
අද දවසේ පුංචි මැතිවරණය මුවවිට තබා
ජනතාවට ඡන්ද අයිතිය වෙනුවට ප්‍රලාප
දොඩමින් ලද අවස්ථාව කල්දැම්මේ
කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වෙමින් පවතී.
මුලදී මුදල් නැතැයිද පසුව මුදල් වී අස්වනු මිළදී
ගැනීමට යොදන යෝජනා ද නැත්තේ
නොවේ.මේ සියල්ලක් එජාප හා පොහොට්ටු
කුමන්ත්‍රණ මිස අනෙකක් නොවේ.
උන්ගේ පරාජය සක්සුදක් සේ පැහැදිලි වෙද්දී
මුන් සිහිවිකල්ලෙන් දොඩවන දෑ
අළුයම ලූ කෙළපිඩක් සේ ඉවත දමමු.
ඡන්ද අයිතිය පාවා නොදී
පාවිච්චි කළයුතුම අවියයි.
මුදලට වඩා සර්වජන ඡන්ද අයිතිය රැක ගන්නට
පෙළගැසෙමු.
ආණ්ඩුවේ මුසාවාද ද.?
නැතිනම් අපේ අයිතියද.? ■

දේශපාලනයේ.. 7 පිටුවෙන්

යන දැඩි මර්ධනකාරී පිළිවෙත නිසා කලින් පැවති සමාජගත දේශපාලන අදහස්වල වෙනසක් සිදු වීම අනිවාර්ය වේ. එහෙත් ඒ වෙනස තවමත් මතු පිටට ඇවිත් නැත. දරුවෙක් පිළිසිඳ ගෙන එළියට එන්නට වුව ද කාලයක් අත්‍යවශ්‍ය නොවැ.

එ නිසා විරාමයක් නැතිව ම අරගලය පවත්වා ගෙන යාමට වෙර දැරීම හරි ද? නැතිනම් අරගලය ඉවරයි කියා දේශපාලනයෙන් පළා යාම හරි ද? එසේත් නැතිනම් අරගලයට එරෙහි වීම හරි ද? ඒ වෙනුවට දැන් කළ යුත්තේ ඊ ළඟ ඓතිහාසික අවස්ථාව පැමිණෙන විට වඩා ඉදිරිගාමී වෙනසක් සඳහා ක්‍රියා කිරීමට ජනතාවට මග පෙන්වන දේශපාලන අදහස් හඳුනා ගෙන ඒවා සමාජ ගත කිරීම නො වේ ද? ඊ ළඟ විභාගයට හොඳින් මුහුණ දීම සඳහා හෝම්වර්ක් (තියරි සහ ප්‍රැක්ටිකල්) කිරීම නො වෙයි ද?

ගෝල් ෆේස් අරගල භූමියෙන් පිළිබිඹු වූයේ ලාංකේය තරුණ පරපුර පතන ආනාගත සමාජය නො වේ ද? ඔලු පළා හෝ හිරේ විලංගුවේ දාලා හෝ එවන් සිහිනයක් මකා දාන්න පුළුවන් ද? ඊ ළඟට එන ඓතිහාසික අවස්ථාවක දී "ඒ සිහිනය සැබෑ වෙන්නට නම් උතුර, දකුණ, නැගෙනහිර, කඳුරට සහ එතෙර පුරවැසියන් අත්වැල් බැඳ ගෙන පාරට බහින්නට ඕනෑ"ය කියන දේශපාලන අදහස සමාජගත වීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් නො වේ ද?

ඊ ළඟ ඓතිහාසික අවස්ථාව ඉක්මනින් පැමිණෙයි ද, පරක්කු වී පැමිණෙයි ද කියා දන්නේ කවුරුන් ද? ඉතිං අපි කළ යුත්තේ කුමක් ද? ■

# හරි හිට්ලර් VS කාඩ්බෝඩ් හිට්ලර්..




**ලෝ**ක ඉතිහාසයේ අතිශය අමානුෂික ඝාතකයා හැටියට සුප්‍රසිද්ධ හිර් හිට්ලර් ගැන අපි වැඩි දෙනෙක් අසා ඇත්තෙමු. එදා දහස් ගණන් ලක්‍ෂ ගණන් යුදෙව්වන් අමු අමුවේ මරා දමා සුපිරිසිදු ජාතියක් ගොඩ නගාගන්නට හිට්ලර් නැමැති ගහලයා සිදුකළ මිනිමැරුම් ඉතිහාසයේ කළු පැල්ලමක් හැටියට අදත් නොමැකී පවතී. එවන් පසුබිමක අපේ රටේද අළුතින් හිට්ලර් කෙනෙකු බිහිවන්නට අර අඳින බව දැන් දැන් පෙනේ. පසුගියදා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ එවන් ඉඟියක් පෑ බවට කව්රුත් දනී. ඉන්ඩියම්ලාගේ අඩි පාරේ යමින් ආගමික අවුලක්ද නිර්මාණය කරමින් ඔහු කළ කථාවක් රටේ පවතින තත්ත්වයන් සමපතෙ වෙතැයි අපට සිතේ.

ශ්‍රී ලාංකේය දේශපාලනය අවුලෙන් අවුලට යමින් පවතින මොහොතක හිට්ලර් පන්නයේ කථාවකින් හෙළිදරව්වන්නේ ඒකාධිපති පාලනයක පසුබිම සකස් කිරීමක් යැයි සැක පහළ වේ. සමස්ත අයවැයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් / බිලියන පන්සියක් ඉක්මවූ මුදලක් ආරක්ෂක අංශවලට වෙන් කරමින් පාලකයින් කිසිදු හිරිකිතයක් නැතුව දීර්ඝ කාලයක් බලයේ රැඳී සිටීමට ගන්නා උත්සහය පරාජය කිරීම මෙරට කම්කරු පන්තියට පැවරෙන දැඩි වගකීමකි. ඊට දැන් සිටම පෙළ ගැසෙන්නට කාලය උදාවී තිබේ. ''අසනි'' දිගින් දිගටම කියා සිටියේ කම්කරු පන්ති නැගිටීමකින් තොරව ජයග්‍රහණයක් නොමැති බවය. ඊනියා ''වාමාංශික'' ජනතාවට පම්පෝරි කථා දුන්නද ප්‍රායෝගිකව මේ පොළව මත සැබෑ අරගලයකට ඔවුහු සූදානම් නොමැති බව සත් සුදක් සේ පැහැදිලිය. මේ කාඩ් බෝඩ් හිට්ලර්ලා පරාජය කරන්නට අඛණ්ඩ වර්ජන රැල්ලක අවශ්‍යතාවය වැඩකරන ජනතාව හොඳින් වටහා ගත යුතුය.

හමුදාව මත යැපී රටට මහ බරක් වන තුන් ලක්‍ෂයක හමුදාවක් නඩත්තු කරමින් මේ දුර්වල පාලකයින් පියවර ගන්නා බව ජනතාවට පැහැදිලිය.

ඉතිං.. රටේ යුද්ධයකුත් නැතිව, වෙනත් කලබගෑනියක් නැතිව කුමකට මේ සා විශාල මුදලක් නාස්තිකරන්නේ ද ? අපි යථාර්ථය තේරුම් ගෙන මේ දුර්ධාන්ත පාලකයින්ට ''අසෙනි'' වැසි වසීවායි ප්‍රාර්ථන කරමු. ■

අරගලයේ පාඩම්.. 3 පිටුවෙන්

නිමින් අරගලයේ අසංවිධානාත්මභාවයෙන් මඟ අවුරමින් පුලුල් මහජන ව්‍යාපාරයක් ලෙස සාමූහික නායකත්වයක් තුළ ඉදිරියට යෑම අත්‍යවශ්‍ය කොන්දේසියක් ලෙස අප හමුවේ නිර්මාණය වී ඇත . එකිනෙකා පක්ෂ හා කණ්ඩායම් අතර අරගලය එම කණ්ඩායම් වල හෝ පක්ෂවල මුලිකත්වයෙන් මෙහෙය වීමට උත්සහ ගැනිම ආපසු හැරවිය නොහැකි විශාල වැරැද්දක් වනවා විතරක් නොව මාරාන්තික පරාජයකටද හේතුවිය හැක.

කම්කරුවන්, ගොවීන් ඇතුළු පීඩිත පංතිකයන්ගේ විමුක්තිය ලඟාකර ගත හැක්කේ ජනතාව මුහුන දෙන දෛනික ගැටළු-ආර්ථික, දේශපාලන, දෘෂ්ඨිවාදීමය-ගැටළු ස්පර්ශ නොකරඑම ජනතාව සමාජය ගැන අවබෝධ ගැන්වීමත්, ඔවුන් ඒ ආකාර පෙළගැස්වීමත් අවසන් වශයෙන් සමාජවාදී ජයග්‍රහනයක් අත්පත් කර ගැනීමත් කල නොහැකි දෙයකි . ඒ නිසා මාක්ස්වාදීන් ඔවුන්ගේ දේශපාලන වැඩපිළිවෙල තුළ අනිවාරයෙන් හදුනාගත් ප්‍රධාන පෙළේ ක්ෂනික ඉල්ලීම් පෙලගැස්වීම කරන්නේ එදනෙදා මතුවන ආර්ථික හා දේශපාලන ගැටළු වෙනුවෙන් පෙනී සිටින්නේද ඒ නිසාය. සමාජ සංවර්ධනයේ අසමාන ස්වාභාවය හේතුවෙන් ඒ ඒ රටවල පවතින විශේෂිත තත්වයන් අනුව එම ගැටළු විවිධාකාර විය හැකිය.
අපට ධනේශ්වර ආර්ථික හා ප්‍රජාතන්ත්‍රවාදී සීමාවන් ක්ෂණිකව අතික්‍රමණය කළ නොහැකිය . එහෙත් එම සීමාවන් සාපේක්ෂව පුළුල්කර ගැනීමේ හැකියාව අප බැහැර නොකරමු. එම සීමාවන් තුළ නිර්ධන පංතියේ උවමනාවන් වෙනුවෙන්, ඔවුන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් හා අනාගත පූර්න ජයග්‍රහන සඳහා බලවේගයන් සූදානම් කිරීම පසුකරවන තත්වයන් වෙනුවෙන් අපට අරගල කළ හැකිය , එසේ කළ යුතුය.

කම්කරුවන් හා ගොවියන් ඇතුළු පීඩිත පංතියන්ගේ විමුක්තිය ලඟාකරගත් හැක්කේ ධනවාදය විතැන්කර සමාජවාදය පිහිටුවීම පමනක් බව අප විස්වාස කරන්නෙමු. ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෝ වෙති. ඒ සඳහා අනාගත ජාත්‍යන්තර සමාජවාදී විප්ලවයේ ජයග්‍රහනය කරා යොමු වූ ජාතික හා ලෝක සමාජවාදී ව්‍යාපාරය ගොඩනැගිය යුතුයව තිබේ. මාක්ස්වාදින්ගේ දේශපාලන වැඩපිළිවෙල තුල එම ක්ෂනික ඉල්ලීම පෙලගැස්වන්නේ පැහැදිලිවම මෙම අරමුණු සමඟ බද්ධවීමට මිස හුදකලා වීමට නොවේ.

පලල් බහුජන අරගලය තුළ විප්ලවවාදීන් සටන් වදින්නේ සමාජවාදී වැඩ පිළිවෙලක් සාක්ෂාත් කිරීමට සහ වාමාංශික විප්ලවකාරී බලවේග වල කාර්ය භාරය පෙරට ගැනීම සඳහාය.

■

ඇහැළියගොඩ, අඟුරුවාමුල්ල, පදිංචි දේව මහින්දදාස වන මා විසින් ඇහැළියගොඩ, මිහිඳු ග්‍රැෆික්ස් ආයතනයේ මුද්‍රණය කරන ලදි.